# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2456/59 – 2025 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා – 2025.10.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත**

5 වැනි වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂංගික විධිවිධාන

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ පළමු වැනි උපලේඛනයේ සඳහන් සංස්පර්ශක රෝගයක් වන අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පැතිරී ගිය බැවින්, එය අධි ව්‍යාධිජනක වෛරසයක් වන බැවින් හා තවදුරටත් පැතිරීමට ඉඩ ඇති හෙයින්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, කස්තූරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල වන මා එම පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක එම පනතේ කාර්යය සඳහා අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) සඳහා අවදානම් ප්‍රදේශයන් ලෙස ද,

(1) ඌරන් රෝග අවදානම් සතුන් ලෙස ද,

මෙම නියමයෙන් තවදුරටත් ප්‍රකාශයට පත් කරමි.

(2) මෙම නියමය, *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළහොත් මිස හෝ එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළහොත් මිස ක්‍රියාත්මක වන දින සිට මාස 03කට නොවැඩි කාලයක් සඳහා වලංගු වන අතර, රෝග තත්ත්වය අනුව කාලය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා,

(1) ඇති වී තිබෙන අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) අවදානම් ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි.

1A – G 045488 – 06 (2025/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I. සත්ත්ව රෝග පනතේ 5 (4) වගන්තිය යටතේ සියලුම අවදානම් සහිත ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හෝ රෝග කාරකය මගින් අපවිත්‍ර වූ කිසිවක්, 1999 දෙසැම්බර් 03 දින අංක 1108/23 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද නියෝගයේ VII ආකෘතියට අනුකූලව කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරිවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව අවදානම් ප්‍රදේශය තුළ හෝ ඉන් පිටතට ප්‍රවාහනය කිරීම, ඉවත් කිරීම, රැගෙන යාම හෝ පලවා හැරීම.

II. ඉහත වගන්තිය ප්‍රකාරව ප්‍රවාහනය සඳහා නිකුත් කළ බලපත්‍රයක් නොමැති ඌරන් මස් පිණිස ඝාතනය කිරීම .

III. මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියකුගේ අවසර පත්‍රයක් නොමැතිව ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හා රෝග කාරකය මගින් අපවිත්‍ර වූ කිසිවක්, විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම සහ ඌරු මස්වලින් නිෂ්පාදන සකස් කිරීම.

IV. අදාළ රෝග හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාදිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යය අපහරණය කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස්වලට අනුව මිස, ජලය සම්බන්ධ කිසිඳු ස්ථානයකට දැමීම, වෙනත් සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ රැගෙන යාමට හැකිවන පරිදි යම් ස්ථානයකට දැමීම හෝ ස්ථානගත කිරීම.

V. මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කරන ලද ඝාතකාගාරයක/ගබඩාවක/ මස් සැකසුම් මධ්‍යස්ථානක හැර වෙනත් ඝාතකාගාරයක/ගබඩාවක/ මස් සැකසුම් මධ්‍යස්ථානක ඝාතනය කිරීම/ ගබඩා කිරීම/ සකස් කිරීම.

03. ආසාදිත නොවූ අභිජනන/ තර කරන/වාණිජ ගොවිපළවල සිටින සතුන් අභිජනනය කිරීම/ විකිණීම/ ඝාතනය කිරීම /මස් සැකසීම පහත සඳහන් නිර්නායක මත පදනම්ව අවසර දෙමි.

I. අභිජනන ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව අභිජනන අංශයේ ලියාපදිංචි අභිජනන ගොවිපලක් විය යුතුය.

II. සතුන් තර කිරීම, අභිජනනය කිරීම, අලෙවි කිරීම හා ඝාතනය කිරීමේදී එම සතුන් මෙම රෝගය සඳහා ආසාදිත නොවන බවට බලයලත් නිලධාරියකු විසින් පරීක්ෂාවකින් තහවුරු කර ගත යුතු වේ.

III. මිලදී ගන්නා/ ලබා ගන්නා ලද / ඝාතනය කරන / සතුන්ගේ ප්‍රවාහනය සඳහා ලබාදුන් සත්ත්ව සෞඛ්‍ය සහතිකවල පිටපතක් සැමවිටම ගොවිපළ/ ඝාතකාගාරය තුළ තබා ගත යුතුවේ.

04. ආසාදනය වූ ගොවිපල තුළට සතුන් ඇතුල් කිරීම -

(1) සතුන් අලුතින් ඇතුල් කර නැවත ගොවිපල ආරම්භ කිරීමට පෙර කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරි වෙතින් මේ සඳහා අනුමැතියක් ලබා ගත යුතු වේ. අපේක්ෂිත ගොවිපල මනාලෙස විෂබීජහරණය වී ඇති බවටත්, ජෛව ආරක්ෂණ ක්‍රමවේද ලබා දී ඇති මාර්ගෝපදේශයන් අනුව පවත්වාගෙන යන බවටත් කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරි විසින් තහවුරු කරගත යුතුවේ.

05. සත්ත්ව රෝග පනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

(1) එම පනතේ 3(3) උප වගන්තිය අනුව සහ මෙම නියෝගයේ 2(1) ඡේදයේ තහනම් කරන ලද ක්‍රියා සිදු කිරීම වැළැක්වීම සඳහා ද ඒ වෙනුවෙන් එම පනතේ 13 සහ 14 වගන්තීන් වල සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද පහත සඳහන් නිලධාරින් බලයලත් නිලධාරින් ලෙස නම් කරමි.

I. අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
II. අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
III. ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරින්, මහා නගර සභා
IV. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
V. සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
VI. විෂයානුබද්ධ විශේෂඥ - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
VII. දිස්ත්‍රික් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සියලුම දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරිවරු
VIII. දිස්ත්‍රික්ක භාර පශු විමර්ශන නිලධාරින්
IX. සියලුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරින් හා ඔහු/ඇය යටතේ සිටින රජයේ පශු වෛද්‍ය නිලධාරින්
X. සියලුම නාගරික පශු වෛද්‍ය නිලධාරින්
XI. සියලුම වනජීවී පශු වෛද්‍ය නිලධාරින්

කස්තුරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13 ,
ගැටඹේ,
පේරාදෙණිය.

EOG 10 - 0033